**එකිනෙකා සමග සම්බන්ධ වුණ සමාජයක්**

# මොබයිල් ඉන්ටනෙට් කුසලතා පුහුණු ආධාරක

## මූලික මොබයිල් ඉන්ටනෙට් කුසලතා පිළිබඳ ජනතාව පුහුණු කිරීමට මගපෙන්වීමක්



Copyright © 2017 GSM Association

case.


# 8. මොඩියුලය - මොබයිල් මුදල් (Mobile Money)

# Bitesize Training


## ඒ කුමක්ද?

මොබයිල් මුදල් සේවාව සහිත ප්‍රාථමික මට්ටමේ ෆෝන්-එකක් පෙන්වන්න. එහි ප්‍රධාන කටයුතු (functions) පෙනෙන සේ, මෙනුව විවෘතව තැබීමට වගබලා ගන්න.

## ඔබට ඕනෑවෙන්නේ මේවාය



මොබයිල් ෆෝන්-එක




මොබයිල් මුදල් පෝස්ටර්

## එය යොදාගතහැක්කේ කුමක් සඳහාද?

**පැහැදිලි කරන්න**:

"මොබයිල් මුදල් ගිණුමක් තිබීම, ඔබේ ෆෝන්-එකේ මුදල් පසුම්බියක් තිබෙන්නාක් වැනි ය. බැංකු ගිණුමක් නැතුව වුවද - මොබයිල් මුදල් සමග, ඔබේ ෆෝන්-එක මගින් ඔබට වෙනත් අයගෙන් මුදල් ගෙන්වා ගැනීමට හෝ යැවීමට හැකි අතර, ගෙවීම් කිරීමේ හැකියාව ද ඇත! ඔබේ මොබයිල් සේවා සැපයුම්කරුවා අනුව; බිල් ගෙවීම, මුදල් ඉතිරි කිරීම හෝ මුදල් ණයට ගැනීම වැනි තවත් දේවල් රැසක් ඔබට කළහැකිය."

**අත්දැකීම් බෙදාහදාගන්න** : පුහුණුකරුවාගේ පෞද්ගලික ජීවිත අත්දැකීම් අනුව, මොබයිල් මුදල් ප්‍රයෝජනවත් වන්නේ කෙසේදැයි විස්තර කරන්න.


පුහුණුවෙන්නාට **එය අදාළ කරන්න**: පුහුණුවෙන්නාගේම ජීවිතයේ කටයුතුවලදී මෙය ප්‍රයෝජනවත් වන්නේ කෙසේදැයි සාකච්ඡා කරන්න.

## එය ක්‍රියාත්මක වෙන්නේ කෙසේද?

ෆෝන්-එක පුහුණුවන්නා අතට දී (හෝ පුහුණුවන්නාගේම ෆෝන්-එකෙන්), මෙම පියවරවලට යාමට උදව්කරන්න

**විදහා දක්වන්න** : පෝස්ටරයේ ඇති පියවර අනුගමනය කර, පුහුණුවන්නාට මිතුරෙකු වෙත මුදල් යවන ආකාරය පෙන්වාදෙන්න.

ඉඟිය: පුහුණුව ආරම්භයේ දීම, දැනටමත් මොබයිල් මුදල් ගිණුමක් ඇති අය කවුරුන්දැයි සොයන්න. මොබයිල් මුදල් ගිණුමක් නැති පුහුණුවන්නන් සිටී නම්, ලියාපදිංචි වීමේ ක්‍රියාවලියේ පියවර ඔස්සේ ගෙනියන්න. (වැඩි විස්තර සඳහා 'ගැඹුරින් විස්තර කර ඇති කොටස' බලන්න).




"ඔබේ ෆෝන්-එකෙන් මිතුරෙකුට මුදල් යැවීම" පෝස්ටරය පෙන්වන්න

**පැහැදිලි කරන්න** : "මම දැන් ඔයාට පෙන්වන්නම්, ඔයාගෙ ෆෝන්-එක භාවිතාකරලා යාලුවෙකුට මුදල් යවන්නේ කොහොමද කියලා"

**කියන්න**: "ඔබට ඇත්තටම, ඔබේ ගිණුමෙන් මුදල් යවන්න ඕනනම්, මේක කරන්න පුළුවන් ඔබේ මොබයිල් මුදල් ගිණුමේ මුදල් නැත්නම් හෝ මේ මොහොතේ දී මුදල් යවන්න අවශ්‍ය නැත්නම්, ඒක කරන විදිය විතරක් මම පෙන්වන්නම්. එතකොට, අනාගතේ දවසක ඒක ඕනවුණොත්, ඔබ දන්නවා කරන විදිය"

## එය ක්‍රියාත්මක වෙන්නේ කෙසේද?

- ඔබේ මොබයිල් සේවා ආයතනයට, ඔවුන්ගේ මොබයිල් මුදල් සේවාව සඳහා කෙටි අංකයක් ඇති. එය සාමාන්‍යයෙන් *123# වැනි අංකයක්. එය ටයිප් කර 'call' බොත්තම ඔබන්න.
- දැන් ඔබට තිරයේ විකල්ප ලැයිස්තුවක් දිස්වේවි. (උදා: 1,2,3,4,5...). ඔබ තෝරාගත යුත්තේ, මුදල් 'transfer' / 'send' විකල්පය යි. මෙය සාමාන්‍යයෙන්, අංක 1 (ඉහළින්ම ඇති) වනු ඇත. ඔබේ ෆෝන්-එකේ යතුරු පුවරුවෙන් අංක 1 ඔබා, ඉන්පසු 'select' / 'ok' බොත්තම ඔබන්න.
- ඔබට මුදල් යැවීම අවශ්‍ය මිතුරාගේ (හෝ පවුලේ සාමාජිකයාගේ) අංකය ටයිප් කරන්න. ඉන්පසු 'select' / 'ok' ඔබන්න.
- ඔබට යැවීමට අවශ්‍ය මුදල් වටිනාකම ඊළඟට ටයිප් කරන්න. (උදා: 100). ඉන්පසු, 'select' / 'ok' ඔබන්න.
- ඔබේ පෞද්ගලික රහස් අංකය (PIN) ඇතුළත් කරන්න. මෙය, ඔබ විසින් විශේෂයෙන් තෝරාගත් - ඔබ පමණක් දන්නා අංකයකි. එයින් ඔබේ ගිණුමේ ආරක්ෂාව සැලසේ. වෙනත් අයෙකුට, අනුමාන කිරීමට අසීරු පෞද්ගලික රහස් අංකයක් තෝරාගන්න. ඊළඟට, 'select' / 'ok' ඔබන්න.
- අවසාන වශයෙන්, අංක 1 ඔබා 'ඔබට මෙම මුදල් යැවීමට අවශ්‍ය බව තහවුරු කරන්න'. ඊළඟට 'select' / 'ok' ඔබන්න. අපේ සුබ පැතුම් ! ඔබ ඔබේ මිතුරාට (හෝ පවුලේ සාමාජිකයාට) මුදල් යවා ඇත !

**ඉඟිය**: පුහුණුවන්නාට ඇත්තටම කිසිම මුදලක් යැවීමට අවශ්‍ය ද නැත්නම්, ඇත්තටම මුදල් නොයවා එය කර බලන්න හැකි බව පෙන්වාදෙන්න.

## පුහුණුවෙන්න


"අපි දැන් දැක්කා, මොබයිල් මුදල් යොදාගෙන මුදල් යවන ආකාරය, ඔබට මුදල් යැවිය හැක්කේ කාටද?"

**පුහුණුකරුවා** : පුහුණුවන්නාට ඔවුන්ගේ මිතුරෙකුට හෝ පවුලේ අයෙකුට මුදල් යවන ආකාරය අත්හදා බැලීමට ඉඩහරින්න. ඕනෑම අවස්ථාවක දී පුහුණුවන්නාට සහාය අවශ්‍ය වුවහොත්, උපකාර කරන්න.


**ඉඟිය**: ඔබේ පෞද්ගලික රහස් අංකය ('PIN number') ඔබට පමණක් සුවිශේෂී - ඔබ පමණක් දන්නා අංකයක් බවට වගබලාගන්න. ඔබේ ගිණුමට ඔබ පිවිසෙන්නේ එමගින් නිසා, එය සුරක්ෂිතව තබාගැනීම ඉතාම වැදගත් ය. මොබයිල් මුදල් නියෝජිතයාට, පාරිභෝගික සේවා කාර්ය මණ්ඩලයට හෝ වෙනත් කිසිවෙකුට - පෞද්ගලිකව හෝ SMS හෝ ඉන්ටනෙට් මගින් හෝ, එය කිසිවිටෙක ලබාදිය යුතු නොවේ!

# පෝස්ටර්,
# කටවුට් සහ
# තොරතුරු පත්‍රිකා


# ඔබේ ෆෝන්-එකෙන් මිතුරෙකුට මුදල් යැවීම




# ඔබේ ෆෝන්-එකෙන් බිලක් ගෙවීම




# මොබයිල් මුදල් යනු මොනවාද?



එය, ඔබේ ෆෝන්-එකේ
මුදල් පසුම්බියක් තිබීම
වැනිය.



ඔබේ මොබයිල් මුදල්
නියෝජිතයා සමග,
ඔබේ මොබයිල් මුදල් ගිණුමට
මුදල් තැන්පත් කිරීමට හෝ
එයින් මුදල් ආපසු ගැනීමට
පුළුවන්.




ඔබට වෙනත් අයට මුදල්
යැවීමට, බිල් ගෙවීමට හෝ
මිලදීගත් භාණ්ඩවලට
ගෙවීමට හැක.




ඔබේ ගිණුම භාවිතා
කළහැකි මාර්ගය,
ඔබේ PIN අංකය යි.

# මොබයිල් මුදල් ගිණුමට ලියාපදිංචි වීම



ඔබේ මොබයිල් සේවා
ආයතනයෙන් ඔබ SIM කාඩ්පතක්
ලබාගෙන තිබිය යුතුය.
ඔබේ මුදල් නියෝජිතයා,
මොබයිල් මුදල් සඳහා ඔබ
ලියාපදිංචි කරයි.



මොබයිල් මුදල් සඳහා
ලියාපදිංචි වීමට ඔබට,
හැඳුනුම්පතකින් අනන්‍යතාව
සහතික කිරීමට සිදුවේ.



ඔබේ ගිණුමෙන් මුදල් ගන්නා
හෝ තැන්පත් කරන සෑමවිටම,
ඔබේ නියෝජිතයා වෙත යන්න.



මෙම පියවර සම්පූර්ණ
කළවිට, ඔබට මොබයිල්
මුදල් භාවිතා කිරීම
පටන්ගත හැක!

# මොබයිල් මුදල්වලින් ඔබට කළහැක්කේ මොනවාද?

මිතුරන්ට හෝ පවුලේ
අයට මුදල් යැවීම

මිතුරන්ගෙන් හෝ පවුලේ
අයගෙන් මුදල් ගෙන්වාගැනීම

බිල් හෝ පාසල් ගාස්තු ගෙවීම

ඔබට හෝ වෙනත් අයට, ගුවන්
කාලය (air time) ලබාගැනීම


වෙනත් රටවල ඉන්නා මිතුරන් හා
පවුලේ අයට/ අයගෙන්,
මුදල් යැවීම/ගෙන්වා ගැනීම

මිලටගත් භාණ්ඩ හා සේවා
සඳහා ගෙවීම

ඔබේ ඉතිරිකිරීම්වලට
පොලී ඉපයීම

ණයක් ලබාගැනීම


## මොබයිල් භාවිතයේ දී සුරක්ෂිතව සිටීම



පණිවුඩය



රහස් අංකය (PIN)




ෆෝන්-එක




නියෝජිතයන්

# මොබයිල් මුදල් ගැන දැනගතයුතු ප්‍රධාන දේවල් 5




→ ගිණුම ලියාපදිංචි කිරීම



→ මොබයිල් මුදල් ගිණුම



→ මොබයිල් මුදල් නියෝජිත



→ මොබයිල් අංකය



→ රහස් අංකය (PIN)

# මොබයිල් මුදල් ගැන දැනගතයුතු ප්‍රධාන දේවල් 5

## ගිණුම ලියාපදිංචි කිරීම

මොබයිල් මුදල් භාවිතාකිරීමට නම්, ඔබ මොබයිල් මුදල් නියෝජිතයෙකු සමග ඒ සඳහා ලියාපදිංචි වියයුතු වන අතර, එම නියෝජිතයා - මොබයිල් මුදල් ගිණුමක් නිර්මාණය කරගැනීමට ඔබට සහාය වනු ඇත. මේ සඳහා ඔබට, SIM කාඩ්පතක් සහ හැඳුනුම්පතක් (ජාතික හැඳුනුම්පත හෝ රියදුරු බලපත්‍රය වැනි) තිබීම අවශ්‍ය වේ.

## මොබයිල් මුදල් ගිණුම

මොබයිල් මුදල් ගිණුම, ඔබේ ෆෝන්-එක තුළ මුදල් පසුම්බියක් තිබෙන්නාක් මෙනි. මොබයිල් මුදල් සමග ඔබට, බැංකු ගිණුමක් නැතිව වුවද විවිධ පාර්ශ්වයන්ගෙන් මුදල් ගෙන්වාගැනීමට හෝ යැවීමට හැකි අතර,ෆෝන්-එකෙන් ගෙවීම් කිරීමට ද හැකිය.

## මොබයිල් මුදල් නියෝජිත


ඔබේ ගිණුමෙන් මුදල් ගන්නා හෝ තැන්පත් කරන සෑමවිටම, ඔබ යා යුත්තේ ඔබේ මොබයිල් මුදල් නියෝජිතයා වෙතයි. ඔබේ ගිණුමේ ගැටලුවක් ඇති විටෙක ඒ සඳහා උදව් වීමට ඔවුන්ට හැකියාව ඇත.

## මොබයිල් අංකය

මොබයිල් ෆෝන් අංකයක් - එනම්, ඔබ ඇමතුම් ගැනීමට හා SMS යැවීමට යොදාගන්නා අංකය - මොබයිල් මුදල් සඳහා වැදගත් වේ. ඔබ, මොබයිල් මුදල් භාවිතාකරන වෙනත් අයෙකු වෙත මුදල් යැවීමේ දී ඔබ යොදාගත යුත්තේ, ඔහු/ඇයගේ මොබයිල් අංකය යි. වෙනත් අයෙකු විසින් ඔබට මුදල් එවීමේ දී ද එවිය යුත්තේ, ඔබේ මොබයිල් අංකය වෙත ය.

## රහස් අංකය (PIN)

ඔබට ඔබේ මොබයිල් මුදල් ගිණුම ආරක්ෂා කරගැනීමට උපකාරී වෙන ඔබේ පෞද්ගලික අංකය මෙය යි. ඔබ මොබයිල් මුදල් භාවිතා කිරීමේ දී, මෙම අංකය ෆෝන්-එකේ ටයිප් කිරීමට සිදුවේ. එය අන් අය අතට පත්නොවන සේ සුරක්ෂිතව තබාගත යුතු වන අතර, කිසිම හේතුවක් නිසා එය වෙනත් කිසිවෙකුට ලබාදියයුතු නොවේ !



# සහතිකය

**මූලික මොබයිල් ඉන්ටනෙට් කුසලතා පුහුණුව**

සම්පූර්ණ කරන ලදී

දිනය

අත්සන් කරන ලදී



# සහතිකය

**මූලික මොබයිල් ඉන්ටනෙට් කුසලතා පුහුණුව**

සම්පූර්ණ කරන ලදී

දිනය

අත්සන් කරන ලදී